www.kalaya.org

# සංස්කෘතික ස්වාධීනත්වය

මිහිඳු මහා රහතන් වහන්සේ මෙරටට වැඩම කළ සමයෙහි මෙහි අධ්‍යාපනය බමුණන් භාරයේ තිබිණි යැයි උපකල්පනය කිරීම යුක්තියුක්ත වෙයි. පණ්ඩුකාභය කුමරු ශාස්ත්‍ර ඉගෙන ගත්තේ පණ්ඩුල නම් බ්‍රාහ්මණයකුගෙන් ය. මේ බමුණන් අර්ධ වෛදිකයන් සමග සියවස් හය හතක් තිස්සේ ලංකාවට පැමිණි අය විය යුතු ය. අර්ධ වෛදිකයන් පූර්ණ වෛදිකයන් නොවුණ ද, යම් බමුණු ආධිපත්‍යයක් සංස්කෘතික ක්ෂෙත්‍රයෙහි තිබෙන්නට ඇත. පණ්ඩුකාභය කුමරුන්ගෙන් පසුව ඒ වන විට ස්වදේශිකයන් බවට පත්ව සිටි යක්ෂ ගෝත්‍රිකයන්ට අර්ධ වෛදිකයන්ගේ දේශපාලන ආධිපත්‍යය බිඳීමට හැකිවුවත් සංස්කෘතික ආධිපත්‍යය බිඳීමට නොහැකි වී ඇත.

මෙහි දී යක්ෂ ගෝත්‍රිකයන් ගැන ද කෙටි සඳහනක් කළ යුතු ය. යක්ෂයන් ද ලංකාවට හා දඹදිවට පැමිණ ඇත්තේ අද ඉරානය නමින් හැඳින්වෙන පර්සියාවෙන් ය. ඔවුන් කවදා දඹදිවට හා ලංකාවට සංක්‍රමණය වී දැයි නිශ්චිත ව කිව නොහැකි නමුත් ආර්යයන් පැමිණීමට සියවස් කිහිපයකට පෙර පැමිණ ඇති බව පැහැදිලි ය. යක්ෂ ගෝත්‍රිකයන්ගේ මුල් බිම පර්සියාවට බටහිරෙන් තිබී ඇති බව පැහැදිලි ය. මේ පිළිබඳ ව තවදුරටත් කරුණු හැදෑරිය යුත්තේ අපේ ඉතිහාසයට ඒ බලපාන බැවින් ය. අප කලින් සඳහන්කර ඇති පරිදි එළාර රජු ද පර්සියාවෙන් පසු කලෙක පැමිණි රජකු විය හැකි ය.

දඹදිවට හා ලංකාවට පැමිණි යක්ෂ ගෝත්‍රිකයන් ඒ ඒ ප්‍රදේශවල කතාකළ භාෂා ඉගෙන ගන්නට ඇති නමුත් තම සංස්කෘතික ලක්ෂණ අත් නොහරින්නට ඇත. ඔවුන් අනෙක් අනාර්ය ගෝත්‍රිකයන්ගෙන් යම් යම් දෑ ගන්නට ඇති මුත් මුල් සංස්කෘතික ලක්ෂණ ඒ ආකාරයෙන් ම පවත්වාගෙන යන්නට ඇතැයි සිතිය හැකි ය. ඒ බව අපට තහවුරුවන්නේ යක්ෂ ගෝත්‍රිකයන් බුදුදහමට දැක්වූ විරෝධාකල්පයත් හේතුකොටගෙන ය. බමුණන් හැරුණු විට බුදුදහමට වඩාත් ම විරුද්ධ වූවෝ යක්ෂයෝ වූහ. ආලවක යක්ෂ දමනය මෙන් ම මහියංගන යක්ෂ දමනය ද අපට මෙහි දී වැදගත් වෙයි. යක්ෂයන් හා බ්‍රාහ්මණයන් අතර ද ප්‍රශ්න තිබුණා නිසැක ය.

ලංකාවේ දී පණ්ඩුකාභය රජු ශ්‍රේෂ්ඨත්වයට පත්වූයේ එතුමා මෙහි වාසය කළ සියළු ගෝත්‍ර එකතුකර එක් ජාතියක් නිර්මාණයකිරීමෙනි. භාරතයේ එදා හෝ ඉන් පෙර හෝ පසුව හෝ කිසිම රජ කෙනකුට එවැන්නක් කළ නොහැකි විය. එහි කිසි දිනෙක, ධර්මාශෝක රජු කාලයේ පවා, කිසිම ජාතික රාජ්‍යයක් ඇති නො වී ය. එහි තිබුණේ වාංශික රාජ්‍යය පමණකි. ඉංගිරිසින් පැමිණ මුළු ඉන්දියාව එකතුකර රාජ්‍යයක් පිහිටුවන තුරු ජාතික රාජ්‍යයක් එහි නො වී ය. ඉංගිරිසින් පිහිටු වූ ජාතික රාජ්‍යයෙහි එකා භාෂාවක් හෝ සංස්කෘතියක් හෝ නො වී ය.

එහෙත් ලංකාවේ එසේ නො වී ය. පණ්ඩුකාභය රජුට මුළු රට ම එක්සේසත් කිරීමට හැකිවිය. මෙහි වැදගත් ම වචනය එක්සේසත් යන්න ය. ඇතැම්විට ඒ සංකල්පය ලංකාවෙන් ම බිහිවූවක් විය හැකි ය. එහි බටහිර නූතන ඒකීය රාජ්‍යයක ඇති ලක්ෂණ ද යම් ආකාරයකට විවිධ බල විවිධ ආයතනවල, ප්‍රදේශවල ගොනුකිරීමක් ද විය. බලය බෙදීමට වඩා ආයතන ගොනුකිරීම යන සංකල්පය අපි මෙහි දී ඉදිරිපත්කරමු. බලය බෙදීම යන්නෙන් අදහස්කරන්නේ එක් තැනකට, ආයතනයකට හිමි වූ බලය වෙනත් ආයතනවලට බෙදාදීම ය. ඒ බෙදාදුන් ඇතැම් බලතල ආපසුගැනීමට හැකි වන අයුරින් හෝ නොහැකිවන අයුරින් හෝ ඒ ක්‍රියාත්මක කළ හැකි ය.

ෆෙඩරල් හෙවත් සන්ධීය රාජ්‍යයක් නිර්මාණය වන්නේ ඉහත ක්‍රමයෙහි විරුද්ධය ලෙස ය. එහි දී ස්වාධීන ව පැවති රාජ්‍ය කිහිපයක් එක් වී ඒ ඒ රාජ්‍යවල ඇතැම් බලතල තම තමන් වෙත ම තබාගනිමින් එක් මධ්‍යම රාජ්‍යයක් පිහිටුවාගනු ලැබෙයි. ඒ තම තමන් වෙත රඳවාගනු ලැබූ බලය මධ්‍යම රාජ්‍යයට නො පැවරෙයි. ඒකීය රාජ්‍යයක ද බෙදාදුන් බලය ආපසු ගත නොහැකි නම් ඒ රාජ්‍යය සන්ධීය රාජ්‍යයකින් මූලික වශයෙන් වෙනස් නො වෙයි. ඒකීය රාජ්‍යයකට අවසාන විග්‍රහයේ දී යම් තත්වයන් යටතේ ප්‍රාන්තවලට ඇති බලතල “මධ්‍යයට” ලබාගැනීමට හැකි වෙයි.

එක් සේසත් රාජ්‍යයක බලතල ගොනු වී ඇති විවිධ ආයතන එක් සේසතක් යටතට ගැනෙයි. එක් සේසත් යන්න සංස්කෘතයෙන් ඒකඡත්‍ර වෙයි. එයින් කියැවෙන්නේ එක් කුඩයක් යන්න ය. එය නිවැරදි නොවිය හැකි ය. සේසත

© Prof. Nalin De Silva

යන්න වැරදි පරිවර්තනයක් ඔස්සේ එසේ කුඩයක් බවට පත්විණි ද යන්න සොයාබැලිය යුතු ය. ඒ කුමක් වුවත් මෙහි දී එක් සේසතක් යටතට ගැනෙන්නේ ඒ ඒ ආයතන මිස ඒ ඒ ආයතන සතු බලතල නොවේ යැයි සිතිය හැකි ය.

මුළු රටට ම බලපාන පරිදි නීති (ව්‍යවස්ථාව ද ඇතුළත් යැයි කියමු. ගැමුණු රජුගේ නොලියැවුණු ව්‍යවස්ථාව ඉංග්‍රීසීන් පැමිණ වෙනස්කරන තෙක් මුළු රටට ම වලිගු වූ ව්‍යවස්ථාව වෙයි.) පැනවීම පැහැදිලිව ම රජුගේ කාර්යයක් විය. වල්ලිපුරම් රන්පතෙන් මෙන් ම ලංකාව පුරාම ඇති සෙල්ලිපිවලින් පැහැදිලිවන්නේ එයයි. දේශපාලන බලය තිබුනේ රජුට ය. ඒ සමග බැඳි ව්‍යවස්ථාදායක බලය ද රජු සතු විය. එහෙත් ආර්ථික හා සංස්කෘතික බලතල වෙනත් ආයතනවලට ද හිමි විය.

රජු වෙනුවෙන් යුවරජවරු ඈපාවරු මාපාවරු ඒ ඒ රටවල් (රුහුණු, මායා, පිහිටි ආදී වශයෙන්) කරවූහ. මුළු රටේ ම ආර්ථිකය මධ්‍යගත ව හැසිරවීමක් නො වී ය. ඒ ඒ ප්‍රදේශවල ගොවිතැන් කරන්නේ කුමක් ද කෙසේ ද ආදිය ඒ ඒ ප්‍රදේශවල අදාළ ආයතන විසින් කෙරිණි. එසේ වුවත් රජු ද අවශ්‍ය ආර්ථික කටයුතුවල දී මැදිහත් විය. ගැමුණු කුමරු දිගාමඩුල්ල වැවීම සඳහා තිස්ස කුමරු පිටත්කර හැරියේ ය.

එහෙත් මේ සියල්ලට ම වඩා සංස්කෘතිය සම්බන්ධයෙන් ගත්කල රජුට වඩා භික්ෂූන්වහන්සේ ප්‍රධාන වූහ. රජු මහාවිහාරයට හා අනෙක් විහාරස්ථානවලට ඉඩකඩම් ඇතුළු නොයෙකුත් දේ පූජා කෙළේ ය. බොහෝ විට ඒ සාංඝික පූජා විය. රජු පමණක් නොව සෙනෙවිවරුන් හා වෙනත් ප්‍රභූන් ද භික්ෂූන්වහන්සේට ලෙන් පූජාකළ බවට සෙල්ලිපිවලින් කියැවෙයි. එහෙත් පූජා හේතුවෙන් භික්ෂූන්වහන්සේගේ ස්වාධීනත්වය නැති නොවී ය. උන්වහන්සේ රජුගේ අනුශාසකයන් වහන්සේ මිස රජුගෙන් වැටුප් හෝ දීමනා ලබන්නෝ නො වූහ. උන්වහන්සේ ජාතියේ මුරදේවි පමණක් නොව ගුරුවරු ද වූහ.

මේ ස්වාධීනත්වය බටහිර රටවල විශ්වවිද්‍යාල සම්ප්‍රදායේ ද යම් ප්‍රමාණයකට විය. බටහිර රටවල විශ්වවිද්‍යාල පිහිටුවනු ලැබුයේ කතෝලික සංස්කෘතියෙහි හා කතෝලික චින්තනයෙහි ය. ඒ විශ්වවිද්‍යාල කතෝලික පල්ලියට විරුද්ධව නොයනතාක් කල් කිසිදු ප්‍රශ්නයක් නො වී ය. ඒ අර්ථයෙන් යම් ස්වාධීනත්වයක් විශ්වවිද්‍යාලවලට හිමිවිය. එහෙත් විශ්වවිද්‍යාල කතෝලික චින්තනයට පටහැණිව යෑමට පටන්ගත් කල මේ ස්වාධීනත්වය අභියෝගයට ලක්විය. පළමු විශ්වවිද්‍යාලය ඉතාලියේ ආරම්භ වූ නමුත් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්නනය විශ්වවිද්‍යාලවල චින්තනය බවට පත්වීමත් සමග පජවයන්සේගේ ආධිපත්‍යයට යටවුණු ඉතාලියේ විශ්වවිද්‍යාලවලට වර්ධනයවීමේ ප්‍රශ්න ඇතිවිය.

ඉන්පසු විශ්වවිද්‍යාල වර්ධනය වුයේ ප්‍රධාන වශයෙන් ම එංගලන්තයේ ය. එංගලන්තය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට තෝතැන්නක් විය. එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් හා කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලවලට විශාල වශයෙන් මධ්‍යකාලීන ධනවතුන්ගෙන් පරිත්‍යාග ලැබී තිබුණ බැවින් ඒ විශ්වවිද්‍යාලවලට ක්‍රිස්තියානි ආගමට හා සංස්කෘතියට අයත් රජුගෙන් හා රාජ්‍යයෙන් යම් ස්වාධීනත්වයක් (autonomy) හිමිවිය. අප අමතක නොකළ යුතු කරුණ නම් විශ්වවිද්‍යාල ස්වාධීනත්වය ක්‍රියාත්මක වුයේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයක යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියක බව ය. යම් චින්තනයක හා යම් සංස්කෘතියක ක්‍රියාත්මක වන ආයතන ඒ සංස්කෘතියට හා චින්තනයට විරුද්ධව නොයනතාක් ගැටළු පැන නො නගියි. කෙසේ වෙතත් මධ්‍යකාලීන ධනවතුන්ට ඉංගිරිසි විශ්වවිද්‍යාලවලට බලපෑම් කළ නොහැකි විය.

එහෙත් ඒ තත්වය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි දිගින් දිගට ම පවත්වාගෙන යෑමට නොහැකි වී තිබේ. විශේෂයෙන් ම ඇමරිකානු එක්සත් ජනපදයෙහි විශ්වවිද්‍යාලවලට ආධාර ලැබුණේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අයත් ධනවතුන්ගෙනි. අවශ්‍ය නම් ඔවුන්ට ධනපතියන් යැයි කිව හැකි ය. ඔවුන් පරිත්‍යාග කෙළේ ආයෝජනය යන සංකල්පයට බාහිර ව නො වේ. නව ධනවත්තු පැරණි ධනවතුන්ට වඩා වෙනස් විය. තමන් ආයෝජනය කළ ධනය වෙනුවෙන් ඔවුහු යමක් බලාපොරොත්තු වූහ. එමෙන් ම තමන්ගේ ම සංස්කෘතියක වූ ආයතනවලට බලපෑම්කිරීමට මේ ධනවතුන්ට හැකියාවක් විය. එහි ප්‍රතිඵලය වී ඇත්තේ අද බටහිර විශ්වවිද්‍යාලවලට එකල එංගලන්තයේ විශ්වවිද්‍යාලවලට තිබූ ස්වාධීනත්වය අහිමි වීම ය. එපමණක් නො වේ. බටහිර නූතනත්වයෙහි වර්තමානයෙහි දී

© Prof. Nalin De Silva

විශ්වවිද්‍යාල යනු තවදුරටත් අනුකලිත (integrated) අධ්‍යාපනයක් ලබාදෙන ආයතන නො වේ. බටහිර නූතනත්වයට ගැලපෙන පරිදි ම අද විශ්වවිද්‍යාලවල පීඨ එකිනෙකින් වෙන් වූ ආයතන බවට පත් වී ඇත.

එමෙන් ම පරයේෂණ සම්බන්ධයෙන් අද විශාල ආයෝජනයක් කිරීමට සිදු වී ඇති බැවින් ඒ පරයේෂණ විවිධ පරයේෂණ ආයතනවල අවශ්‍යතා අනුව සිදු කෙරෙයි. ඇමරිකානු එක්සත් ජනපදයෙහි පරයේෂණ සඳහා හමුදාවලින් ආධාර කරන බව බොහෝ දෙනා නො දනිති. කලාකරුවන්ට ඊනියා ස්වාධීනත්වයක් තිබිය යුතු යැයි පවසන ප්‍රබුද්ධයනට අද ලෝකයේ බටහිර විද්‍යාඥයන්ට ස්වාධීනත්වයක් නැති බව නො දනිති. එලෙස රජයෙන් හා වෙනත් ආයතනවලින් වෙන් වූ ස්වාධිනත්වයක් නැතිව විශ්වවිද්‍යාල සමස්තයක් ලෙස ගත්කල අද බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ආකෘතියෙහි ක්‍රියාත්මක වෙයි.

බටහිර විශ්වවිද්‍යාලවල ස්වාධීනත්වය එසේ පිරිහී ඇති බැවින් අද ඒ ආයතන බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ම ආයුධ බවට පත්වී ඇත. මේ ආයතනවලින් ගැලීලියෝලා වැන්නන් බිහිවේ යැයි සිතන්නට අපහසු ය. ගැලීලියෝ විද්වතා කතෝලික චින්තනයේ ආයතන වූ විශ්වවිද්‍යාලවල උගන්වමින් ඒ චින්තනයට පටහැණි මත පළ කෙළේ ය. එහෙත් වර්තමාන බටහිර විශ්වවිද්‍යාලවලින් එවැන්නක් බලාපොරොත්තු විය නො හැකි ය. අද බටහිර විශ්වවිද්‍යාලවලින් කෙරෙන්නේ වැඩිම වුවහොත් සුසමාදර්ශී (paradigmatic) වෙනස්කමක් පමණ ය. චින්තනයකට සුසමාදර්ශයකට වඩා ගැඹුරු පදනමක් ඇත. බටහිර විශ්වවිද්‍යාලවලට ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය වෙනුවට විකල්ප චින්තනයක් ඇතිකිරීමටවත් බටහිර නූතනත්වයෙන් ගැලවීමටවත් නො හැකි ය. ඊනියා පශ්චාත්නූතනවාදී කතා බොරු මනස්ගාත වන්නේ එබැවිනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva